# දැන්වීමයි

## කළමනාකරණ හා මූල්‍ය පීඨයේ තෙවන වසර (2021/2022 ප්‍රවේශ වර්ෂය) ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නේවාසික කාලය අවසන් වීම.

එළියකන්ද නව කාන්තා නේවාසිකාගාරයේ සහ එළියකන්ද පිරිමි නේවාසිකාගාරයේ දැනට නේවාසිකව සිටින කළමනාකරණ හා මූල්‍ය පීඨයේ තෙවන වසර (2021/2022 ප්‍රවේශ වර්ෂය) 2024/2025 අධ්‍යයන කටයුතු හදාරන ශිෂ්‍ය කණ්ඩායමට අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පළමු සමාසික පරීක්ෂණ 2025.09.10 දිනෙන් අවසන් වීමට නියමිතව ඇත.

ඒ අනුව එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පළමු සමාසික පරීක්ෂණ 2025.09.10 දිනෙන් අවසන් වූ පසු එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් 2025.09.11 දින මධ්‍යහ්න 12.00 ට පෙර අදාළ උපශාලාධිපතිවරුන් දැනුවත්කර තමන් වෙත භාර දුන් භාණ්ඩ සහිත කාමර නිසි පරිදි භාර දී නේවාසික ලේඛනයේ අත්සන් කර අයවීමක් නොමැති බවට සටහන් තබා ගැනීමෙන් පසු නේවාසිකාගාරයෙන් ඉවත්විය යුතු බව දන්වා සිටිමි.

තවද, නේවාසිකාගාරය තුල පවතින ඔබගේ පුද්ගලික භාණ්ඩද එම දිනයේදීම ඉවත් කරගතයුතු අතර එදිනෙන් පසු එම පුද්ගලික භාණ්ඩ සඳහා විශ්වවිද්‍යාලය මගින් වගකීමක් ගනු නොලබන බව මෙයින් දැනුම් දෙමි.

ඉහත සඳහන් ශිෂ්‍ය කණ්ඩායම සඳහා අවසන් වසර වෙනුවෙන් නේවාසිකාගාර පහසුකම් හිමි ලේඛනය පීඨය වෙත ලබා දී ඇත.

සහකාර ලේඛකාධිකාරි
ශිෂ්‍ය කටයුතු අංශය
2025.09.04

පිටපත - පීඨාධිපති/කළමනාකරණ හා මූල්‍ය පීඨය
ශාලාධිපති/ශාලාධිපතිනි
නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක/කළමනාකරණ හා මූල්‍ය පීඨය
නියෝජ්‍ය ලේඛකාධිකාරි/කළමනාකරණ හා මූල්‍ය පීඨය
ප්‍රධාන ආරක්ෂක නිලධාරි
උපශාලාධිපති/එළියකන්ද පිරිමි නේවාසිකාගාරය
උපශාලාධිපතිනි/ එළියකන්ද නව කාන්තා නේවාසිකාගාරය